**ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය - 2016**

---

ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 7(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**

-------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

-----------------------------------------------

මුදල් ප්‍රවාහයට බලපෑමක් සිදුනොකරන පසුගිය වර්ෂයට අදාල තොග ගැලපීම රු.3,212,560 ක් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

**(ආ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

-------------------------------------------

(i) ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම වෙන වෙනම තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණු අතර ඉඩම් වෙනුවෙන්ද සියයට 5 ක ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ii) කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමින් යුත් පාරම්පරික වත්කම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ පුස්තකාලය සඳහා පරිත්‍යාග ලෙස උපාංග සහිත ඩෙක්ස්ටොප් පරිගණකයක් හා ස්කෑනර් යන්ත්‍රයක් ලැබී තිබූ අතර එම භාණ්ඩවල වටිනාකම ඇස්තමේන්තු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම හා ලැබිය යුතු පොලී රු.36,626 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මධ්‍යස්ථානය විසින් 1998 වර්ෂයේදී ජේ.ආර්. ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමති පෞද්ගලික සමාගමක කර තිබූ ආයෝජන ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4.3 ක් දක්වා තිබූ අතර 2008 වර්ෂයේදී මෙම ආයතනය වසා දැමීමේ දී එහි වත්කම් රු.61,500 කට අගය කර තිබුණි. ආයතනය වසා දමා වර්ෂ 8 ක් ගතවී තිබුණද එම අයකරගත නොහැකි ශේෂය හා වත්කම් සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 ජනවාරි 01 දිනට සංචිත හා රඳවාගත් ලාභ ශේෂය රු.33,759,354 ක් වුවද එය රු.33,871,339 ක් ලෙස ඉදිරියට ගෙන ගොස් තිබීම හේතුවෙන් රඳවාගත් ලාභ රු.111,985 ක් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන දෙකකට හා පුද්ගලයින් තිදෙනෙකුට කුලියට ලබාදී තිබුණු ගොඩනැගිලිවලින් පිළිවෙලින් රු.479,600 ක් සහ රු.1,845,108 ක් වර්ෂ 2 කට වඩා අධික කාලයක සිට අයවිය යුතුව තිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන එකතුව රු.93,184 ක් වූ හර ශේෂ 03 ක් හා බැර ශේෂ 03 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 4 (I) (ඇ) වගන්තිය | පනත අනුව ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ටේප් පටි ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම ආයතනයේ වගකීමක් වුවත් මෙම වාර්තාවේ දින වන විටත් මෙම ද්‍රව්‍ය ඩිජිටල් තාක්ෂණයට මාරුකර හෝ සංරක්ෂණයකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 හා 2016 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක | 2016 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණු අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක්ද |

| | |
|---|---|
| 05/2016 | පත්කර නොතිබුණි. |
| (ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.11 වගන්තිය | ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගී වන සියලුම ලංසුකරුවන් විසින් නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු.1,537,239 ක ප්‍රසම්පාදනයේදී ආයතනය විසින් ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.3 (අ) (ආ) වගන්ති | මාසික මූල්‍ය ප්‍රකාශන සෑම මාසයකම පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර මාස 06 කට වරක් කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා කිරීම හා එහි වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද 2015 දෙසැම්බර් 09 දිනෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩල රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2015 මැයි 25 දිනැති අංක පීඊඞී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කාර්මික සහකාර සහ විදුලි කාර්මික තනතුරු දරන සේවකයන් දෙදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන වියදම් ලෙස රු.89,000 ක් ගෙවා තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ලැබිය යුතු පොලී ආදායම තුළ දක්වා තිබූ රු.9,397 ක් හා ගෙවියයුතු ලෙස දක්වා තිබුණු රු.187,363 ක හඳුනානොගත් ශේෂ විධිමත් අනුමැතියකින් තොරව ජර්නල් සටහන් මගින් ගිණුම්වලින් කපාහැර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු වලින් රු.2,510,103 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,384,454 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසදීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,894,557 ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2016 වර්ෂයේදී ගොඩනැගිලි කුලී ආදායම් රු.3,030,549 කින් හා ශාලා වෙන්කිරීමේ ගාස්තු රු.1,687,477 කින් හා ස්ථාවර තැන්පතු පොලී රු.1,008,442 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල සලකා බැලීමේදී 2012 හා 2013 වර්ෂ වලදී අතිරික්තයක් පැවති නමුත් 2014 හා 2015 වර්ෂ වලදී ඌනතාවයක් ද නැවතත් සමාලෝචිත වර්ෂයේදී අතිරික්තයක් ද ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී මධ්‍යස්ථානයේ දායකත්වය අඛණ්ඩව

වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කර තිබූ අතර 2012 වර්ෂයේ රු.12,092,793 ක් වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.20,568,938 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**3.2** කාරක ප්‍රාග්ධන කළමනාකරණය
-----------------------------------------

මධ්‍යස්ථානයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 5.8:1 ක් වූ ජංගම වත්කම් අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 7.3:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය 7.1:1 ක්ව පැවතුනි. ජංගම වත්කම් තුළ සියයට 82 ක් කෙටිකාලීන ආයෝජන වලින් නියෝජනය විය.

**4.** මෙහෙයුම් සමාලෝචනය
------------------------------

**4.1** කාර්යසාධනය
-----------------

හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ලියකියවිලි, ලිපිගොනු, සිහිවටන, ලැබූ ප්‍රදාන ත්‍යාග තැන්පත් කර තැබීම, ඒවා ආරක්ෂාව හා සංරක්ෂණය, ප්‍රදර්ශනය, විද්වත් රැස්වීම් පැවැත්වීම, රාජ්‍ය ලේඛනාගාරයට පවරනු ලබන සියළු වාර්තා හා මුද්‍රිත ද්‍රව්‍ය තබාගැනීම ආදිය මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු වන අතර එම අරමුණු ඉටුකර ගැනීමට අදාළව මධ්‍යස්ථානයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.18,854,500 ක් වැය කර ඉටුකිරීමට අපේක්ෂා කළ කාර්යයන් 30 ක් අතුරින් ඇස්තමේන්තු වටිනාකම රු.16,714,500 ක් වූ කාර්යයන් 22 ක් ඉටුකර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ඖෂධීය පැළ තවානක් සහ නව රථගාලක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද එම කාර්යයන් සිදුකිරීමට නොහැකිවීම හේතුවෙන් ඒවා 2016 වර්ෂයේදී ද නැවතත් ද ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද , 2016 වර්ෂය තුළදී ද එම කාර්යයන් සම්පූර්ණ කිරීමට මධ්‍යස්ථානය අපොහොසත් වී තිබුණි.

(ඇ) ආයතනයේ ප්‍රගති වාර්තාවට අනුව සැලසුම් කර ඉටු නොකරන ලද කාර්යයන් බොහොමයක් ඉටු නොකිරීමට හේතු ලෙස මූල්‍යමය ගැටළු දක්වා ඇති අතර මේ අනුව ආයතනය විසින් වාර්ෂික සැලසුම් සකස්කිරීමේ දුර්වලතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ආදායම් ලෙස රු.16,364,597 ක් හඳුනාගෙන තිබූ අතර ගොඩනැගිලි කුලියට ලබාදීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික තක්සේරු කුලී වාර්තාවක් ලබා නොගෙන විවිධ මාසික කුලී යටතේ ගොඩනැගිලි කුලියට ලබා දී තිබුණි.

(ආ) ආයතනය මගින් දේශන ශාලා පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) දේශන ශාලා පහසුකම් ලබාදීමට අදාළ ගිවිසුම ප්‍රකාරව ගෙවීම පැහැර හරින ඕනෑම අවස්ථාවක ගිවිසුම අවලංගු කිරීමේ අයිතිය මධ්‍යස්ථානය සතු විය. එහෙත් ගිවිසුම

පැහැර හැර තිබූ දේශකයෙකු වෙත ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කිරීමෙන් තොරව අඛණ්ඩව දේශන ශාලා පහසුකම් ලබාදී තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට රු.1,104,216 ක් අයවිය යුතුව තිබුණි.

(ii) ගිවිසුම ප්‍රකාරව සිසුන් සඳහා දේශන පැවැත්වීමට පමණක් මෙම දේශන ශාලා පහසුකම් යොදාගත යුතු වුවද ඊට පටහැනි ලෙස එක් දේශකයෙකු විසින් තවත් දේශකයන් 08 දෙනෙකුට මධ්‍යස්ථානයේ අනුමැතියකින් තොරව දේශන ශාලා පහසුකම් ලබාදී ආයතනයට ලැබිය යුතු ආදායම් අහිමි කර තිබුණි.

(ඇ) මධ්‍යස්ථානයේ පුස්තකාලයේ විකිණීම සඳහා රු.471,500 ක් වටිනා ප්‍රකාශන 05 ක පිටපත් 2500 ක් මුද්‍රණය වෙනුවෙන් 2013 දෙසැම්බර් 18 දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට රු.264,040 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. මෙම වාර්තාවේ දින වන විටත් මෙම ප්‍රකාශන වලින් ප්‍රකාශන 04 ක් මුද්‍රණය කර ආයතනය වෙත භාරදී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඈ) අකුණු සැර වැදීම නිසා හානිවූ, මධ්‍යස්ථානයේ ආරක්ෂක කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා රු.340,500 ක් වැයකර තිබූ නමුත් රක්ෂණ ආයතනය විසින් ප්‍රතිපූර්ණය කළ මුදල රු.192,375 ක් වූයෙන් ආයතනයට රු.148,125 ක පාඩුවක් සිදුවී තිබුණි. රක්ෂණ ආවරණය ලබාගැනීමේදී සවිකළ යුතු අකුණු නිවාරකයක් සවිනොකිරීම හේතුවෙන් මෙම පාඩුව දැරීමට සිදුවී තිබුණි.

(ඉ) 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ (3) ඡේදය ප්‍රකාරව ජනරජයේ ජනාධිපතිවරයා, ජීවත්ව සිටින ආදි ජනාධිපතිවරු, අගමැතිවරයා, කථානායකවරයා, විරුද්ධ පක්ෂයේ නායකවරයා, ජනාධිපති ලේකම්, ජාතික ලේඛනාගාරයේ අධ්‍යක්ෂකවරයා හා ජනාධිපතිවරයා පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. යථෝක්ත පුද්ගලයන් රැස්කරගෙන පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් හා පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ගනුදෙනු සිදුකරන බැවින් පාලක මණ්ඩල රැස්වීම් විධිමත්ව පැවැත්වීමට හැකිවන පරිදි පනත සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෞද්ගලික බැංකුවක ඉතුරුම් තැන්පතුවක රු.219,141 ක් ආයෝජනය කර තිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ සුභසාධක සංගමය මගින් පවත්වාගෙන යන ආපන ශාලාව සඳහා අනුමැතියකින් තොරව අරක්කැමි, අරක්කැමි සහායක, කම්කරු වශයෙන් තිදෙනෙකු බඳවාගෙන ආයතනයේ අරමුදල් වලින් 2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා රු.2,575,975 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

2013 වර්ෂයේදී මිලදීගත් යතුරු පැදියක් 2014 ඔක්තෝබර් 21 දිනෙන් පසු භාවිතයට ගෙන නොතිබුණු අතර ඒ සඳහා වාර්ෂික රක්ෂණ ගාස්තු, ආදායම් බලපත්‍ර ගාස්තු සහ වාර්ෂික දුම් පරීක්ෂණ ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.20,116 ක් ගෙවා තිබුණි.

**4.5** කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 පරිච්ඡේදයේ (ආ) සහ (ඇ) වගන්තිවලට අනුව මධ්‍යස්ථානය සඳහා අනුමත කාර්යමණ්ඩලයක් සහිත සංවිධාන සටහනක් නොතිබුණු අතර නිලධාරීන් 30 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 9.3.1 (අ) වගන්තියට අනුව මධ්‍යස්ථානයේ බඳවාගැනීමේ පරිපාටියක් සකස්කර තිබුණ ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය ඇතිව පාලක මණ්ඩලයේ සහ අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) පුස්තකාලයට අනුයුක්තව ස්ථිර සේවකයින් 07 දෙනෙකු සේවයේ යෙදී සිටියදී 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 වගන්තියට පටහැනිව ලේකම් ජනරාල්වරයාගේ අනුමැතිය මත 2016 වර්ෂයේදී පුස්තකාල පුහුණුකරුවන් ලෙස 08 දෙනෙකු බඳවාගෙන රු.241,900 ක් ගෙවීම් කර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් රියදුරන් දෙදෙනෙකුගේ දීමනා සැලකීමේදී වැටුප් විෂමතාවයක් නිරීක්ෂණය වූ අතර එක් නිලධාරියෙකුට 2013 ජූලි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.27,300 ක් අඩුවෙන් වැටුප් හා වේතන ගෙවා තිබුණි.

**5.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**5.1** අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.2 ඡේදයේ ආකෘතිය ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණු අතර අයවැය ගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 18 සිට 100 දක්වා වූ පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොතිබු බව නිරීක්ෂණය විය.

**5.2** අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති ඩීඑම්ජ් 2009 (i) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ මුදල් කටයුතු පිළිබඳව අභ්‍යන්තර පාලනය ඇති කිරීම සඳහාත් එම කටයුතු වල වැරදි හා වංචා වැලක්වීමට සහ අනාවරණය කරගැනීමට ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම සඳහාත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගත යුතු වුවත් මධ්‍යස්ථානය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5.3** වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2011 වර්ෂයෙන් පසුව මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ ලේකම් ජනරාල් වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ආදායම් පාලනය | (i) තක්සේරු වාර්තා ලබානොගැනීම හා බදු ගිවිසුම් විධිමත්ව ක්‍රියාත්මක නොවීම.<br>(ii) මුදල් භාරගැනීම සඳහා ඇති පරිගණක පද්ධතියේ සහ මුදල් රැස්කිරීමේ දුර්වලතා පැවතීම. |
| (ආ) පුස්තකාල පරිපාලනය | පුස්තකාලයේ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා පැවතීම. |
| (ඇ) උපදේශන සේවා ගෙවීම් පාලනය | විධිමත් ගිවිසුමකින් තොරව උපදේශන සේවා ලබාගැනීම. |
| (ඈ) ප්‍රසම්පාදන පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම. |
| (ඉ) කාර්යමණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පරිපාටිය හා සේවක සංඛ්‍යාවන් අනුමත කරනොගැනීම. |